ත්‍රෛමාසික මෙතෙළුරක අන්තර්ජාල ප්‍රකාශය

දීපිකා

දෙසැම්බර්- පෙබරවාරි කලාපය

ඡායාරූපය
ලහිරු දිල්ෂාන්
(ආර්ථික සංවර්ධන නිලධාරි)

මනමේ වැදි දෙටුවා සොයා මානස චිලට

ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කරගන්නා ආකාරය

ඉරණම හරි ???

මේ අපේ මෙහෙවරයි

වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය ප්‍රකාශනයකි

දිනුම් කණුව

මනස සහ මොළය අතර නුදුසුලා වීමට..

ඉරණම හරි ???

එක් කාලෙක ජපන් සෙන්පතියෙකුට සටනට යෑමට සිදු වුණා. ඒත් ඔහු ළඟ සිටි සේනාව ප්‍රමාණවත් වුණේ නැහැ. ඒනිසා සටන ජයග්‍රහණය කරන්න පුලුවන් වෙයි කියලා සේනාවගේ කිසිසේත්ම විශ්වාසයක් තිබුණේ නැහැ. මොකද සතුරු පාර්ශවයේ විශාල සේනාවක් හිටියා.
නමුත් සටන් කළ යුතුව තිබුණා.
ජපන් සෙන්පතියා විසින් සේනාව කැඳවා මෙලෙස පැවසුවා.
"මම මේ කාසිය උඩ දානවා. කාසියේ හිස පැත්ත වැටුණොත් අපි දිනනවා. නැත්නම් අපි පරදිනවා. අපේ ඉරණම මේ කාසිය පවසාවි."
සෙන්පතියා කාසිය උඩ දැමුවා.
කාසියේ හිස පැත්ත බිමට වැටුණා. සේනාව උද්දාමයට පත් වුණා. ඔවුන්ට තමන් ගැන ලොකු විශ්වාසයක් ඇති වුණා. සටනට හොඳින් මුහුණ දී සතුරන් පරාජය කොට සටන ජයගත්තා.
සටන ජය අරගෙන එන අතර සේනාවේ හිටපු භටයෙක් සෙන්පතියාට මෙලෙස පැවසුවා.
"ඉරණම වෙනස් කරන්න කාටවත් බැහැ නේද?"
ඔව් ඔබ හරි සෙන්පතියා එලෙස පවසමින් කාසිය පෙන්නුවා.
කාසියේ තිබුණේ හිස පැත්ත පමණයි.
ගොඩක් අය හිතන්නේ වැඩක් කරනකොට පිරිස වැඩියෙන් ඉන්න ඕනේ පිරිස අඩුවෙන කොට තමන්ට වැඩේ කරන්න බැහැ කියලා. තමන්ට තමන් ගැන විශ්වාසයක් තියෙනවනම් පිරිසේ ප්‍රමාණය බලපාන්නේ නැහැ. තමන්ගේ හැකියාව හා දක්ෂතාවය ගැන විශ්වාසයක් තියලා වැඩ කරන්න. ඔබට වරදින්න එකක් නැහැ.

(පරිවර්තනය)
රංගන සජීව
ප්‍රාදේශීය ලේකම්

මනමේ 'වැදි දෙවුවා' සොයපු 'මානස විලව'

කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ වරකාපොල නගරය පසුකොට මදක් ඉදිරියට යන විට මේ අපුරු මිනිසා වෙසෙන නිවස අපට හමු වෙයි. ඔහු හමුවන්නට නිවසට ගොඩ වඳින විට තවත් අපුරු ස්ථානයක් අප නෙත ගැටෙයි. ඒ මනස්කාන්ත වටපිටාවක වරකාපොල මා ඔයේ ගලා බසින අතු ඇළක් අසබඩ තනා ඇති පේරාදෙණිය වළ ඕහිපත් කරන මානස විලයි. විටෙක සැඩවද තවත් විටෙක නිසලව ගලා බසින ඇළෙහි සිසිලසත් වටපිටාවේ සිරි ඇති තුරු ලතාවල සැඟව සිටින සියොතුන්ගේ ගී හඬත් මානස විලේ සොඳුරු බව තවත් තීව්‍ර කරයි. අපි සොයා ගිය ඔහු වරකාපොල කොට්ඨාසයට ආඩම්බරයක් ගෙනෙන ලේඛකයෙක්,රංගන ශිල්පියෙක්, කවියෙක් මෙන්ම වෘත්තියෙන් හිටපු සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගණිතය පිළිබඳ අධ්‍යාපන අධ්‍යක්ෂක කේ.ඒ. ජයන්ත සරත් විජේරත්න මහතායි.

ගණිතඥ, ප්‍රවීන කලාකරු ජයන්ත සරත් විජේරත්න මහතා සමඟ

සොඳුරු කතාබහක්

ඔබව හඳුන්වන්න කැමැති මොන විදියටද?
ඉතාම සරල මනුස්සයෙක්.

අද දවස ගෙවන්නේ කොහොමද?
අද මම විශ්‍රාමික සුවයෙන් පසු වෙන්නේ. වැඩි කාලයක් ලේඛන කලාවේ නියැලෙනවා. මේ වන විට පොත් දහයකට වැඩි ප්‍රමාණයක් රචනා කරලා තියෙනවා. කවි පොත් වගේම ගණිතය සම්බන්ධ පොත් . ඒ වගේම ඔලිම්පියාඩ් ගණිත තරග විභාගයේ විෂය මාලාව සකස් කරනවා. කැගල්ල ශාන්ත මරියා විද්‍යාලයේ තාරකා විද්‍යාව පිළිබඳ පුහුණු මධ්‍යස්ථානයේ උපදේශකවරයෙක් විදියට සේවය කරනවා.

"අපේ අම්මලාට විද්‍යාව ගණිතය විෂයන් ගැන හොඳ ප්‍රායෝගික දැනුමක් තිබුණා."

ඔබේ පාසල් කාලය මතක් කරමුද ?

මගේ පාසල තෝලංගමුව මධ්‍ය මහා විද්‍යාලය. මාව පාසලට භාර දෙන කොට පළමු වසර දෙවැනි වසරට නියමිත පෙළ පොත කියවන්න පුලුවන්. ඒ නිසා මට ඩබල් ප්‍රමෝෂන් එකක් විදියට පන්ති දෙකක් ඉහළට යන්න පුලුවන් වුණා. මම සාමාන්‍ය පෙළ හා උසස් පෙළ කළේ මට වඩා වසර දෙකකින් වැඩිමහල් අයත් එක්ක. මගේ අම්මා තමයි මට හැමදේම කියලා දුන්නෙ.

අම්මලා විෂය කරුණු ඉගෙන තිබුණේ නැති වුණාට විද්‍යාව ගණිතය විෂයන් ගැන හොඳ ප්‍රායෝගික දැනුමක් තිබුණා. මට මතකයි දවසක් රොටී හදන්න මම ලිප පත්තු කරනවා දර පුරවලා. අම්මා ඇහුවා දැන් තැටිය රත් වෙලාද කියලා. මං කිව්වා අම්මේ තවම මේකේ ඒවලන අංකය පත් වුණේ නැහැ කියලා. අම්මා කිව්වා ඒවලන අංකය නෙවෙයි ඔය ලිපට පොඩ්ඩක් හුස්ම ගන්න ඉඩ දීපන් කියලා දර කැලි ටික ලිප ඇතුළට චාතය යන්න පුලුවන් විදියට දර ටික ඇතුරුවා. ඒ අම්මලාගේ විද්‍යාව.

ඒ වගේම තමයි මට කරන්න දෙයක් හිතුණොත් මම කොහොමහරි කරනවා. මට උසස්පෙළ විභාගයට ගණිත විෂය හදාරන්න ඕනෑ වුණා. ඒත් මාව තෝරගෙන තිබුණේ විද්‍යා විෂයට. මම උත්සාහ කළා ගණිත විෂය තෝරා ගන්න. ඒත් බැරි වුණා. ඊට පස්සේ මම පුස්තකාලෙන් ගණිත පොත් ගෙනත් තනියම ගණන් හැදුවා. මම එකම වසරේ පාසලෙන් විද්‍යා විෂයටත් පුද්ගලික අයදුම්කරුවෙකු විදියට ගණිත විෂයටත් චාඩි වුණා. විෂයන් දෙකටම මට ඩී සාමාර්ථ තියෙනවා.

මට වයස අවුරුදු **18** සම්පූර්ණ වන විටම ගුරු පත්වීමක් ලැබෙනවා. ගණිත ගුරුවරයෙක් විදියට පාසල් ගණනාවක සේවය කළා. අදටත් මම දරුවන්ට ගණිතය උගන්වනවා. **1986** සිට **2015** දක්වා **6** වසරේ සිට **11** වසර දක්වා ගණිත පෙළ පොත් ලියන්න මම දායක වුණා.

මම දරුවන්ට ගණිතය උගන්වන්න නාට්‍ය හැදුවා.

ගණිතයයි කලාවයි එකිනෙකට සම්බන්ධ කර ගත්තේ කොහොමද?
ගණිතය කියන්නේ රටාවක්. හරිම ලස්සන රටාවල් තියෙනවා. ගණිතය රලු වෙලා තියෙන්නේ විෂය අමුවෙන් උගන්නන්න ගියාම. හැම විෂයකටම රිද්ම රටාවක් තියෙනවා. ගණිතයෙත් අපුරු රිද්මයක් තියෙනවා. ඒක හරියට වටහා ගන්න ඕනෑ. මම ගණිතය දරුවන්ට උගන්වන්න නාට්‍ය හැදුවා. මුලින්ම හැදුවේ පොලිය ගැන. දරුවන්ට පොලිය ගැන ඉගැන්නුවේ ගණිත නාට්‍යයකින්. සාහිත්‍යයෙන් දරුවෝ හරිම පහසුවෙන් ගණිත මූල ධර්ම ඉගෙන ගත්තා. ගණිතය ගැන ඇල්මක් ඇති වුණා. ඇත්තටම ගණිතය ඔවුන් රස විඳලා කිව්වොත් හරි.

ගණිතයයි කලාවයි එකිනෙකට සම්බන්ධ කර ගත්තේ කොහොමද?

ගණිතය කියන්නේ රටාවක්. හරිම ලස්සන රටාවල් තියෙනවා. ගණිතය රලු වෙලා තියෙන්නේ විෂය අමුවෙන් උගන්නන්න ගියාම. හැම විෂයකටම රිද්ම රටාවක් තියෙනවා. ගණිතයෙත් අපුරු රිද්මයක් තියෙනවා. ඒක හරියට වටහා ගන්න ඕනෑ. මම ගණිතය දරුවන්ට උගන්වන්න නාට්‍ය හැදුවා. මුලින්ම හැදුවේ පොලිය ගැන . දරුවන්ට පොලිය ගැන ඉගැන්නුවේ ගණිත නාට්‍යයකින්. සාහිත්‍යයෙන් දරුවෝ හරිම පහසුවෙන් ගණිත මූල ධර්ම ඉගෙන ගත්තා. ගණිතය ගැන ඇල්මක් ඇති වුණා. ඇත්තටම ගණිතය ඔවුන් රස විඳලා කිව්වොත් හරි.

පවුලේ විස්තර ටිකක් කියමුද?

මගේ අම්මා එස්. විල්ලරආරච්චි. ඇය ගෘහණියක් . නාත්නා දයානන්ද සිරිසෝම විජේරත්න. ඔහු සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය පරීක්ෂක නිළධාරියෙක්. ඒ වගේම හොඳ කවියෙක්. මම දුෂ්කර පාසල් සේවයේ රාජකාරි කරන කොට අපි ලියුම් ගනු දෙනු කළේ කවියෙන්. ඔහු ජීවතුන් අතර නැහැ. මම තමයි පවුලේ වැඩිමහල් දරුවා. මට මල්ලි කෙනෙක් ඉන්නේ. ඔහු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක්. මගේ බිරිඳ ප්‍රියංගනී කුමාරි විජේරත්න. ඇය කලාවට ගොඩක් ලැදියි. ඇය ගීත රචිකාවියක්.ගීත තිහක් පමණ මේ වන විට රචනා කරලා තියෙනවා. ඒ ගීත ගුවන් විදුලියේ ප්‍රචාරය වෙනවා. ඒ වගේම ලේඛිකාවක්. මට ඉන්නේ දුවලා දෙන්නෙක් . ලොකු දුව ඉන්දූ චාපා කුමුදුමලි . පොඩි දුව සඳමාධවී අයෝධ්‍යා. ඇය මෘදුකාංග ඉංජිනේරුවරියක්. විවාහකයි. එංගලන්තයේ ජීවත්වෙන්නේ. මේ දවස්වල නිවාඩුවට ලංකාවට ඇවිත් ඉන්නේ.

ඔබේ වැඩකටයුතුවලට බිරිඳගෙන් ලැබෙන සහාය දකින්නේ කොහොමද?

ඇය තමයි මගේ ශක්තිය.මට ඇය නැති ජීවිතයක් හිතා ගන්න අමාරුයි. අපි දෙන්නා උපාධිය හැදෑරුවේ එකට. ඇයත් ගුරුවරියක්.මම ඒ කාලේ කාර්යබහුල ජීවිතයක් ගත කළේ. ඒ නිසා දරුවෝ දෙන්නා වෙනුවෙන් ඇය රැකියාවෙන් පවා ඉවත් වුණා.මගේ ජීවිත කාලය පුරාවට ලබා දුන් ඒ සහාය අපරිමිතයි.

ඔබ කලක් එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සෙවණේ නිහඬව ගොඩ නැගුණු අපුරු කලාකරුවෙක්?
මනමේ නාට්‍ය යේ වැදි දෙටුවාගේ චරිතය ට වසර ගණනාවක් මම පණ දුන්නා. සරච්චන්ද්‍රයන්ගේ සියලුම වේදිකා නාට්‍යවල රංග භූමි පාලකචරයා වුණේ මම. ඔහුගේ නාට්‍යවල ගායක කණ්ඩායමටත් සම්බන්ධ වෙලා හිටියා.

කලාකරුවන්ට තමන්ගේ නිර්මාණ එළි දක්වන්න තෝතැන්නක් වුණු මානස විල නිර්මාණය කරන්න අදහස ආවේ කොහොමද?
ඇත්තටම ගොඩක් අය හිතුවේ මේ මානස විල නිෂ්ඵල ව්‍යායාමයක් කියලා. ඒත් මට නම් එහෙම හිතුණේ නැහැ. නාට්‍ය පුරුදු වෙන්න. මංගල දර්ශන තියන්න. මුහුරත් උළෙලක් තියන්න. තමන්ගේ නාට්‍ය වේදිකා ගත කරන්න තැනක් හොයන කලාකරුවන්ට තැනක් හදන්න ඕනෑකියලා මට හිතුණා. මොකද ගොඩක් කලාකරුවන්ට මේ කාරණාවලට වැඩි වියදමක් දරන්න බැහැ. ඒකට හොඳම තැනක් තමයි මානස විල. මෙතනට ඇවිත් ඕනෑම අයකුට නිදහසේ වැඩ කරන්න පුලුවන්. කොළඹට හා නුවරට අතරමැද වරකාපොල තියෙන්නේ. ඒ නිසා පහසුවෙන් ළඟා වෙන්නත් පුලුවන්. මම මේ මානස විල කලාකරුවන්ට ලබා දෙන්නේ නොමිලේ. මම මේකට සිරිවැය හඳාගත්තේ මගේ ගෙදර නවීකරණය කරන්න තිබුණු මුදලින්. ඒ දවස්වල මම වැඩ ඇරිලා ඇවිත් ගල් වැලි උඩ ඉඳන් පල්ලෙහාට ගෙනියනවා. සති අන්තේ බාසුන්නැහැ කෙනෙක් එක්ක ගල්වලින් වටේට වලේ බැම්ම බඳිනවා. මම තමයි බාසුන්නැහැට අත්වැඩ දෙන්නේ. ඒ වගේ අමාරුවෙන් මම මේ මානස විල ගොඩ නැගුවේ. අද මෙතන නවක කලාකරුවන් තමන්ගේ කලා නිර්මාණ එළි දක්වන කොට හිතට පුදුම සතුටක් දැනෙන්නේ.
ඉදිරි වැඩකටයුතු සැලසුම් කරලා තියෙන්නේ කොහොමද?
හෙටක් ගැන ලොකු අදහසක් නැහැ. භෞතික සම්පත්වලින් ඇත් වෙලා අධ්‍යාත්මික සුවය අත් කරගන්න උත්සාහ කරනවා.
සටහන චලානී හේරත්

අමතක කරන්න එපා...!!!

වාහන ආදායම් බලපත්‍රය ගන්න එද්දි මේවා අරං එන්න

- වාහනයේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත
- වාහනය සඳහා මූල්‍ය පහසුකමක් ලබා ඇත්නම් මාස දෙකක් තුළ ලබා ගත් මූල්‍ය සමාගම විසින් වාහනයේ ලියාපදිංචි සහතිකයේ සහතික කරන ල පිටපතක් (මෙහිදී අදාළ මූල්‍ය සමාගම නමින් ලියාපදිංචි වී තිබිය යුතුය)
- වලංගු රක්ෂණ සහතිකය
- දින 90 ක් තුළ ලබා ගත් වායු විමෝචන සහතිකය
- පෙර වර්ෂයේ ආදායම් බලපත්‍රය හෝ එහි පිටපතක්
- මෝටර් ලොරි, ලොරි ට්‍රේලර්, කෝච්, විශේෂ කාර්ය වාහන, ගිලන් රථ, අවමංගල රථ සඳහා මාස 2 ක් තුළ පළාතේ අනුමත ගරාජයකින් ලබා ගත් යෝග්‍යතා සහතිකය
- බම්පර් බස් රථ සඳහා වලංගු මගී අවසර පත්‍රය

ඔබටත් ප්‍රාණ ඉඩහසර...

වරකාපොල කොට්ඨාසයේ ඔබෙත් දරුවන්ගෙත් නිර්මාණශීලි හැකියාවන්ට අවස්ථාව ලබාදීමට අප සුදානම්.
ප්‍රාණ ත්‍රෛමාසික සඟරාවේ ලබන කලාපයට ඔබේ නිර්මාණ praanamagazine@gmail.com හෝ
0706368628 දුරකතන අංකයට Whatsapp කරන්න.
ඔබේ අදහස්, යෝජනා, ගැටළු ද අපට යොමු කරන්න..
මේ ඉඩහසර ඒ සඳහාමය.

-සංස්කාරක-

වළගම්බා රජු දිය කෙළි කළ තෙලි ඇල්ල

සුන්දර වටපිටාවක විශාල ගල් තලාවක් මතින් ගලා බසින තෙලි ඇල්ල වරකාපොල කොට්ඨාසයේ ඇති ස්වභාව සෞන්දර්යට කදිම නිදසුනකි. ගුරුගොඩ ඔයෙහි අතු ගාබාවකින් නිර්මාණය වූ මේ සුන්දර දිය ඇල්ල වළගම්බා රජු හා සබැඳි ඓතිහාසික කතා පුවතක් වටා දිව යයි.

පැරැන්නන් පවසන ආකාරයට එදා වළගම්බා රජු සිය බිසව සමඟ දිය ස්නානය සඳහා යන්නේ මේ ඇල්ල වෙතටයි. එහිදී බිසව අතින් රන් හලියක් මේ ගඟට වැටී ඇත. ඒ නිසා තාලි ඇල්ල ලෙස නම් බැඳුණු අතර පසුකලකදී තෙලි ඇල්ල නමින් ව්‍යවහාර වී ඇත.

ස්වාභාව සෞන්දර්ය විඳ ගැනීමට කැමති සංචාරයේ යෙදෙන අයට දවසක් ගත කරන්නට මේ තෙලි ඇල්ල අපූරු ස්ථානයකි. කොළඹ දෙසින් එන විට කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ වරකාපොල පසු කළ විට නෙලුන්දෙනිය හංදියෙන් දැදිගම පාරේ සුන්දර රබර් වතු යායවල් කුඹුරු යායවල් පසුකරමින් ගමන් ගන්නා විට තුතොට හංදිය මුණ ගැසේ. තෙලි ඇල්ලට ගමන් ගන්නා මාර්ගය සංඥා පුවරුව සඳහන් කොට ඇති අතර ඒ මාර්ගය තරමක් වනගත ස්වරූපයක් ගනී. සුන්දර වටපිටාවක පිහිටා ඇති මේ තෙලි ඇල්ලේ කුඩා දිය ඇලි තුනක් දක්නට ඇත. ඒවා නම් කර ඇත්තේ තෙලි ඇල්ල, ගබඩා ඇල්ල හා කණුවැන්දුම් ඇල්ල නමිනි. මේ තෙලි ඇල්ල සුන්දර ඇල්ලක් මෙන්ම මිනිස් ජීවිත බිලි ගන්නා භයානක ඇල්ලක් බව ගම්වාසීන් පවසයි. කාර්යබහුල ජීවිත ගත කරන ඔබත් මානසික වීඩාව දුරු කරගන්නට මේ ඇල්ලේ දවසක් ගත කරන්නේ නම් නාගරීකරණයෙන් මිදුණු ග්‍රාමීය වටපිටාවක් ඇති අවට පරිසරයට හානි නොකර තෙලි ඇල්ලේ සැබෑ සුන්දරත්වය විඳගන්න.

-වලානි හේරත්-

නිදහස් දිනයට සමගාමීව ශ්‍රමදානයක්...

77වන ජාතික නිදහස් දිනයට සමගාමීව වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ මඟපෙන්වීම හා මූලිකත්වයෙන් කාර්යාලීය පරිශ්‍රයේ දී නිදහස් දින සැමරීම කාර්යාලීය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු වූ අතර, කාර්යාලීය පරිශ්‍රය හා ඒ අවට මාර්ගය පිරිසිදු කරමින් ශ්‍රමදානයක්ද පැවැත්විය.

වරකාපොල ව්‍යවසාය අලෙවි ප්‍රදර්ශනය දෙදිනක් පුරා වරකාපොල මහජන ක්‍රීඩාංගනයේදී..

වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යවසායක සංසදය එක්ව දෙදිනක් පුරා වරකාපොල ව්‍යවසාය 2024 අලෙවි ප්‍රදර්ශනය සාර්ථක අන්දමින් පැවැත්විය. අලෙවිකුටි 37 ක් සහ ව්‍යවසායකයන් 80 කට ආසන්න පිරිසක් සමගින් වරකාපොල මහජන ක්‍රීඩාංගනයේ පැවැත් වූ මේ අලෙවි ප්‍රදර්ශනයට වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතා , කැගල්ල දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ රාජපක්ෂ මහතා හා ආරාධිතයින් රැසක් සහභාගී විය. මෙහිදී විවිධ ආහාර වර්ග, ඇඳුම් පැලඳුම්, විසිතුරු භාණ්ඩ ඇතුලු නිවසට අවැසි බොහෝ දේ ඉතා පහසු මිලකට ලබා ගැනීමට එහිදී පාරිභෝගිකයින්ට හැකි විය. ව්‍යවසායක පරපුරක් ලෙස නිර්මාණය කර, සවිබල ගන්වා ජාතික තලයට ඔසවා තැබීමේ අරමුණු ඇතිව මේ ප්‍රදර්ශනය හා අලෙවි පොළ මෙවරත් පැවැත්විය. එහිදී රිළවුන් පලවාහැරීම සඳහා නිර්මාණය කර තිබූ උපකරණ පාරිභෝගිකයින්ගේ වැඩි අවධානයට ලක් වීම එහිදී විශේෂත්වයක් විය.

සම්බන්ධීකරණ මහා සභා රැස්වීමේදී ප්‍රශ්න රැසකට කඩිනම් විසඳුම්...

මෙරට ඉදිරි සංවර්ධන කටයුතු හා අනෙක් පියවරයන් සම්බන්ධව සාකච්ඡා කිරීමටත්, කිම මට්ටමේ පවතින ගැටලු හා ඒවාට ගතහැකි ක්‍රියා මාර්ගයන් පිළිබඳව විමසා බලා විසඳුම් ලබා දීමේ අරමුණින් සම්බන්ධීකරණ මහා සභා රැස්වීම වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන රැස්වීම ශාලාවේදී පැවැත්විය. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝජ් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් වරකාපොල ප්‍රදේශීය ලේකම් රංගන සජීව මහතාගේ මූලිකත්වයෙන් හා අනෙක් රාජ්‍ය ආයතනවල සහභාගිත්වයෙන් කමිටු රැස්වීම සාර්ථක ලෙස ආරම්භ විය. කොට්ඨාසයේ විවිධ ක්ෂේත්‍රයන් තුළ පවතින අර්බුධකාරී තත්ත්වයන් පිළිබඳව වඩාත් පුළුල් ලෙස සාකච්ඡාවට ලක් කරමින් කඩිනම් පිළිතුරු ලබා දීමත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමත් ජන ජීවිතය පවතින තත්ත්වයෙන් ඉහළට නඟා සිටුවා ශක්තිමත් ආර්ථිකයක් සමගින් යහපත් සමාජයක් බිහි කරලීමේ නැවුම් බලාපොරොත්තුවක් මෙය පවත්වන ලදී.

ශිල්පාභිමානී ජයග්‍රහණ රැසක් වරකාපොලට...

2024 ශිල්ප අභිමානී හස්ත කර්මාන්ත තරඟාවලියේ දී ජනාධිපති සම්මානයෙන් ජනරම ඔනික් ආයතනය පිදුම් ලැබූ අතර නව නිර්මාණ සඳහා දොරවක චන්ද්‍රිකා බෑග් ආයතනය දිනා ගනු ලැබීය. වාණිජ මණ්ඩලය හා **NEDA** ආයතනය එක්ව සංවිධානය කරන සබරගමු පළාත් විශිෂ්ඨතම ව්‍යවසායකයින් තේරීමේ තරඟයේ කර්මාන්ත අංශයේ හොඳම ව්‍යවසායකයා ලෙස වරකාපොල **PBK apparel** ආයතනයත්, සේවා අංශයෙන් උදානී සැලෝන් අඬිපුස්ස ආයතනයත් ජයග්‍රහණය හිමිකරගන්නා ලදී.

2025 ග්‍රාමාභිමානී

සබරගමුව පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය සහ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කළ ග්‍රාමාභිමානී 2025 ප්‍රදර්ශනය හා අලෙවි පොල අද දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ප්‍රධාන රැස්වීම් ශාලාවේදී පැවැත්විය.

සබරගමු පළාත් ගරු ආණ්ඩුකාරවර වම්පා ජානකී රාජරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝජ් රාජපක්ෂ මහතා, කැහැල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් දිලීප හමිලත් මහතා, ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ පළාත් අධ්‍යක්ෂතුමිය, වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතා ඇතුළු සම්මාවනීය අමුත්තන් රැසකගේ සහභාගිත්වයෙන් සමාරම්භය සනිටුහන් විය.

වරකාපෙ ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බලමණ්ඩලයට අයත් ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයන්ගේ ආර්ථික තත්ත්වය ඉහළට ඔසවා තැබීමේ ප්‍රමුඛ පරමාර්ථය පෙරදැරිව දින දහතුනක පුහුණුවක් ඒවිධ ක්ෂේත්‍ර යටතේ ලබා දෙමින් සාර්ථක ව්‍යවසායකයින් ලෙස දේශීය ආර්ථිකට දායක වන දිරිමත් පුද්ගලයින් ලෙස සමාජයට දායාද කිරීමේ මාහැඟි කටයුත්ත මෙලෙසින් සිදු විය.

පොඩ්ඩන්ගේ රෑ රටා

චමත්කා රශ්මි - 7 වසර
නියදුරුපොල කනිෂ්ඨ විදුහල

චමත්කා රශ්මි - 7 වසර
නියදුරුපොල කනිෂ්ඨ විදුහල

වදස් ජනත්වින්
3 වසර - 95 අල්ගම

නදීජා සත්සරණී -නිවටුව
රෝසකැකුළු ළමා සමාජය

විහංසා දම්සාරි
6 ශ්‍රේණිය - ඔත්නාපිටිය ක.වි

චමත්කා රශ්මි - 7 වසර
නියදුරුපොල කනිෂ්ඨ විදුහල

චමත්කා රශ්මි - 7 වසර
නියදුරුපොල කනිෂ්ඨ විදුහල

අමෝදා මෙත්මිනි - 2 ශ්‍රේණිය
ඩඩිලි සේනානායක විද්‍යාලය

කේ.ජී. පියුමි ශාකය්‍යා - 9 වසර
බෝසත් ළමා සමාජය

චමත්කා රශ්මි - 7 වසර
නියදුරුපොල කනිෂ්ඨ විදුහල

ඒ.ශාෂා මර් යම් -8 වසර
සිරහඬක්කුම් සිට්ටුක්කල් ළමා සමාජය

ආර්.ඒ. රිහා -1 වසර
සිරහඬක්කුම් සිට්ටුක්කල් ළමා සමාජය

ජේ.එස්.ඉස්මා
සිරහඬක්කුම් සිට්ටුක්කල් ළමා සමාජය

අශිනි කවිශා -2 වසර
ඕපාත වසම

ලේ දන්දීමේ කඳවුරක්...

කැගල්ල ලේ බැංකුවේ හදිසි අවශ්‍යතාවයක් මත වරකාපොල ග්‍රාම සංවර්ධන බල මණ්ඩලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව පසුගියදා ලේ දන්දීමේ කඳවුරක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවනාගාරයේදී සාර්ථක අන්දමින් පැවත්විය. වරකාපොල ප්‍රාදේශීය ලේකම්තුමාගේ මග පෙන්වීම මත කැගල්ල මහ රෝහලේ කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව මෙය පවත්වන ලදී.

තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන වරකාපොලදී..

තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය සඳහා ආකර්ෂණය කර ගැනීම නිමිති කර ගෙන පවත්වත්නට යෙදුන තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහනට අදාළව පහළ ලෙනාගල ග්‍රාමය කේන්ද්‍ර කර ගනිමින් කෘෂි යන්ත්‍රෝපකරණ බෙදා දීමේ වැඩසටහන 2025.01.31 දින පවත්වත්නට යෙදුණි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරීන්ගේ මැදිහත් වීම මත වැඩසටහන පැවැත්විය. තෝරාගත් ව්‍යවසායකයින් 25ක් සඳහා රුපියල් මිලියන 3 ආසන්න කෘෂි යන්ත්‍රෝපකරණ බෙදා දීම සඳහා කැගල්ල දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝජ් රාජපක්ෂ මහතා, වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතා, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ සමන් නිලකසිරි මහතා, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙලගෙදර මහත්මිය හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සහභාගී විය.

ආයුර්වේද සංරක්ෂණ සහ වෛද්‍යවරුන්ට වෙනිවැල්ගැට පැළ බෙදා දීමේ වැඩසටහනක්..

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආයුර්වේද සංරක්ෂණ සහ වෛද්‍යවරුන් සඳහා වෙනිවැල්ගැට පැළ බෙදා දීම පසුගියදා වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ මූලිකත්වයෙන් වරකාපොල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති කැගල්ල දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝජ් රාජපක්ෂ මහතාගේ සහභාගිත්වයෙන් කාර්යාල පරිශ්‍රයේදී සිදු කෙරුණි.

ප්‍රාදේශීය රැකියා වෙළඳ පොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පරිශ්‍රයේදී...

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරන ලද ප්‍රාදේශීය රැකියා පොල 2025.01.31 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පරිශ්‍රයේ දී පැවැත්විණි. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝජ් රාජපක්ෂ මහතාගේ මූලිකත්වයෙන් වරකාපොල ප්‍රාදේශීය ලේකම් රංගන සජීව මහතාගේ මගපෙන්වීම මත වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සියලුම නිලධාරීන්ගේ සහයෝගයෙන්, මානව සම්පත් සංවර්ධන නිලධාරී චන්ද්‍රානි වීරවර්ධන හා ලක්ෂ්මි විජේරත්න මහත්මියගේ වැඩසටහන් සංවිධානයෙන් සමාරම්භය සිදුවුණි. මේ සඳහා පොදුගලික ආයතන, රාජ්‍ය හා පුහුණු ආයතන රැකියා අපේක්ෂිතයන් හට සේවාව සැපයීය. රැකියා සිහිනය, සිහිනයක් නොව යථාර්ථය බවට පත් කර ගැනීමට ලද මහඟු අවස්ථාවක් බවට මෙම වැඩසටහන හැඳින්විය හැක.

කොටි බැග

ඔබගේ කාර්යයන් සරල කර ගැනීම සඳහා

පුද්ගල / හවුල් ව්‍යාපාර නාමයක්

ලියාපදිංචි කරගන්නා ආකාරය

අයදුම්කරු විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ අංශය වෙත පැමිණ එහි ඇති ඉල්ලීමේ ලිපියක් නිසි ලෙස සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් පසු රු. 27 ක් ගෙවා අයදුම්පතක් ලබා ගන්න. එයද නිවැරදිව සම්පූර්ණ කර භාර දෙන්න.

නිවැරදි ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් ඔබගේ කාලය, ශ්‍රමය ඉතිරිකරගන්න...

අවශ්‍යය ලියකියවිලි

- එහිදී හවුල් ව්‍යාපාරයක් නම් හවුල්කරුවන් සියලු දෙනා ඉල්ලුම්පත්‍රයේ අත්සන් තැබිය යුතුය. හවුල් ගිවිසුම ද ඉදිරිපත් කළ යුතු වේ.
- ග්‍රාම නිලධාරි සහතික කළ ජාතික හැඳුනුම්පත්වල ජායා පිටපතක්
- ව්‍යාපාරිකයා වෙනත් කොට්ඨාසයක පදිංචි නම් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ වසමේ ග්‍රාම නිලධාරීන්ගෙන් ලබා ගත් පදිංචි සහතිකය
- පුද්ගලික ඉඩමක් නම් ග්‍රාම නිලධාරි සහතික කළ ඔප්පුවේ ජායා පිටපතක්
- බදු හෝ කුලී පදනම මත නම් අදාළ ඔප්පුවල හා ගිවිසුම්වල ග්‍රාම නිලධාරි සහතික කළ ජායාපිටපත් සමග ඉඩම් හිමියාගේ අවසර සහිත ලිපියක්
- අදාළ ඉඩම ඥාතියකුට හිමි ස්ථානයක් නම් ඥාතියාගේ අවසරය සහිත ප්‍රකාශයක් සහ ග්‍රාම නිලධාරි සහතික කළ ඉඩමේ ඔප්පුවේ ජායා පිටපතක්
- ව්‍යාපාරය තහවුරු කර ගත හැකි සහතික

- පළිබෝධ නාශක, කෘමි නාශක, රසායනික පොහොර අලෙවි සැලක් නම් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය
- මුද්‍රණාලයක් නම් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් අනුමැතිය
- චිත්‍රපටි නිෂ්පාදන ව්‍යාපාරයක් නම් චිත්‍රපට සංස්ථාවේ අනුමැතිය
- මැණික් වෙළඳාම හා කැපීමේ ආනයනය කිරීමේ ව්‍යාපාරයක් නම් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අනුමැතිය
- බටහිර ඖෂධ වෙළඳ සැලක් නම් ඖෂධවේදී ඖෂධවේදී සහතිකය හා පළාත් සෞඛ්‍ය වෛද්‍ය අධිකාරියේ අනුමැතිය
- බාහිර රෝගී පරීක්ෂණ කටයුතු සායනයක් පවත්වාගෙන යන්නේ නම් පළාත් සෞඛ්‍ය වෛද්‍ය අධිකාරීගේ අනුමැතිය

- ප්‍රාදේශීය සභාවට වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු ගෙවූ ලදුපත හා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙළඳ බලපත්‍රයේ සහතික කළ පිටපතක්
- ව්‍යාපාරයේ ස්වභාවය අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අනුමැතිය අවශ්‍ය වේ.
  උදා- ආහාර නිෂ්පාදන
- නාම පුවරුවක් සවිකර තිබිය යුතුයි.
- ව්‍යාපාර නාම ලියාපදිංචි සඳහා අයකරන ගාස්තුව ගෙවිය යුතුය.
(ව්‍යාපාරයට යොදන ප්‍රාග්ධනය අනුව මුදල වෙනස් වේ.)

කෙටි කතාව

වළං කඳ

අම්මාත් අප්පච්චිත් හොම පොළවේ හිඳ ගෙන කුටුකුටු ගාන්නේ කුමක්දැයි ඇසීමට තරම් මට උවමනාවක් නොවූයේ තව ඩිංගිත්තකින් මා අවදි විය යුතු බව හැඟී ගිය නිසාවෙනි. යන්තම් දැස් විවර කර පැදුරේ කෙලවර දෙස බැලූ විට වුටි නංගි දැත් දෙකකුල් අතරේ සිරකරගෙන සිතලට ගුලි වී නිදා සිටිනු දුටුවෙමි. ගම්මානයේ කෙලවර පිහිටි අපේ කුඩා ගෙපැල සිට නගරයට යාමට බොහෝ වේලා ගතවන බව මට දැනෙන විට අප්පච්චිත් අම්මාත් අපි දෙදෙනා බලාගන්නට දරන වෙර වීරිය ගැන සිතමින් එය අමතක කරන්නට මට හැකි වුණි. ගෙදර සිට ගම්මැදිඳිය පසුකර අතුරු පාරට ගෙන් කිරිමටත් සැතපුම්කට වඩා වැඩි බව අප්පච්චි නිතර කියයි. අතුරු මාවතේද ඇත්තේ එකම බසයක් වුවත් උදේට නම් අප්පච්චිත් මාත් කවදාවත් ඒ බසයෙන් වළං කඳ රැගෙන නගරයට ගොස් නැත. හැමදාමත් වළං කඳ කරේ තුවාගන්නා අප්පච්චි පිටුපසින් වැටෙන මම උදේ නවය දහය වන විට නගරයට ළඟා වන්නේ හොඳටම හෙම්බත් විය.

උදෙන්ම ගියොත් වෙහෙස අඩු බව අප්පච්චි හැමදාමත් කියන නිසා තවත් නින්දේ නොසිට පැදුරේ ඉදගතිමි.

"පුතේ අප්පච්චිත් එක්ක අදත් පලයන්" යැයි නොකියාම "උඹ හැඟිට්ටාදැයි" මා අවදි වූ බව දැනගත් අම්මා ඇසිය. අප්පච්චි වළං කඳ සුදානම් කරන දෙස බැලූ මම මැටි කළය ළඟට ගොස් පිරිතිබුණු වතුරෙන් දෝතක් ගෙන මුණට දමා ගැසූ මම දැස් හැර වටපිට බලන විට අප්පච්චි අම්මාගේ විත්ත රෙදි කඩකින් සාදා ගත් රෙදි පොට්ටනිය ඒ මත වළං කඳ නුවා බලනු මම දුටුවෙමි. දුඹුරු පැහැති සරම කැහැපට ගසාගත් අප්පච්චි කමිසයක් කවදාවත් නොඳිත බව දැන සිටියෙමි. අම්මා අප්පච්චි ළඟට ගොස්

"තියෙන්නේ මේච්චරයි. විකුණා ගත්ත බැරි වුනොත් අත්තිම බස් එකේ එන්න මේක තියා ගනිල්ලා "

යැයි කියනු මට ඇසිණි. මා ඕම තිබූ මැටි කළයෙන් පොල්කට්ටට වතුර පෙරාගෙන දෙවරක් බී අප්පච්චි පසුපස වැටුනෙමි. බොහෝ දුරක් එන තෙක් කිසිත් නොකියූ අප්පච්චි බස් පාරට ළංවන විට "දැන් ළඟයි " යැයි පැවසුවේ මගේ දෙසට යන්තම් හැරි බලමිනි. ගුරු පාරෙන් ගැලවුනු නාර නිසාවෙන් වලවල් හැරී ඇති බස් පාරට සේන්දු වන විට ඉහළ ගම් මැද්දේ සිට නගරය බලා ඇදෙන බසය නුමි.... හඩින් අප පසු කර ගියේය. අප්පච්චි වළං කඳ කර තබාගෙන ගමන් කරන්නේ උඩ පැන පැන දැයි වරෙක මට සිතුණි. එහි බර උරහිසට නොදැනෙන ලෙස කඳ ඉහළ යන විට අඩි මාරු කරන බව අප්පච්චි මට පෙරදාක කියා ඇත.

දැන් ඉර එළිය ටිකක් සැරට පායන නිසාම අප්පච්චිගේ ඇඟ දාඩියෙන් තෙත්වී සරමද බාගයකට වැඩිය තෙත් වී ඇත. කඳ කරේ තියාගෙන යන විට කළු සිහින් අප්පච්චිගේ සිරුරේ ඇටකුරු එහා මෙහා මාරුවන හැටිත් දාඩියට සිරුර දිළිසෙන හැටිත් මා වරින් වර දුටුවිමි. නගරය සමීපයට පැමිණි අප්පච්චි සරම් පොට අතර නුවාගෙන තිබූ බුලත් විටෙන් ටිකක් ගෙන කටට දමාගෙන යමං තව ටිකයි යැයි කියා නැවතත් වළං කඳ කරේ නුවාගත්තේය. මා ඒ අසල වූ රත්මලු පැදුර මතක් වූයෙන් විගහට දිව ගොස් රත්මලු අතුරක් කඩාගෙන කළු පැහැ ගැන්වී තිබූ රත්මල් ගෙඩි කීපයක්ද කඩාගෙන කටේ රුවා ගත්තෙමි.කඩමංඩියක් සහිත කුඩා නගරයට ළඟා වන විට උදේ දහය කිට්ටු වී තිබුණැයි මට සිතුණි. දැන්නම් බඩගිනිත් ඉවසන්න බැරි තරම් දැනෙන්ට විය. අප්පච්චිට වළං දෙක තුනක්වත් විකුණන තුරු මා බලා සිටියේ කෑමට යමක් අරන්දෙන බව මා දන්නා නිසාවෙනි.

බොහෝ වේලා වළං කඳ තබාගෙන " වළං වළං" යැයි කියූ නමුත් වළං මිලදී ගැනීමට එදින නම් පැමිණි අයකු නම් නොවිය. මහත්වරු නෝනාවරු අප පසු කර යන විට වළං කඳත් අප දෙදෙනාත් දෙස බලා නැවත ගමන ඉක්මන් කර අප පසුකර යියමං කරයි. මඳ වේලාවක් බලා සිටි අප්පච්චි වළං කඳ කර තබා ගත්තේ මා දෙස තුන් හතර වතාවක් බැලීමෙන් පසුවය.

"ඉස්සරහ මං අදුනන මුදලාලි කෙනෙක් ඉන්නවා යමං වළං ටිකක් දෙන්න පුළුවන්ද බලන්ඩ"

යැයි කියමින් නැවතත් ගමනට වුයේය. මා දන්නා තරමින් අප්පච්චි හඳුනන මුදලාලි කෙනෙක් සම්පතයෙක් ඇතැයි මට නොසිතුන නමුත් අප්පච්චි සමග එකිනෙකා පසු කර ඉදිරියට ඇදුහෙමි. දැන්නම් බඩගින්න ඉවසන්න බැරි තරමිය. ඉවසා සිටිය නොහැකි නැහ

"අප්පච්චි වතුර ටිකක් බොන්න තිබුනා නම් හොඳයි"

කිවේ ඇසෙන නැසෙන හඩිනි. "ඔහොම හිටිං බලන්ඩ" යැයි කියූ අප්පච්චි අසල කඩයට කඳ බිම තබා ගොඩ වී බෙලෙක් කෝප්පයක් පිරෙන්න රැගෙන ආ වතුර මම එක හුස්මට බී අප්පච්චි දෙස බැලුයෙමි. "මං බිවා" යැයි කියා කඩය ඇතුලට ගොඩ වූ අප්පච්චි නැවත පැමිණ වළං කඳ කර තබාගෙන පාර අයිනේ කඩවල් දෙස බලමින් ඉදිරියට ඇදුණි.

"ඔහොම ඩිංගක් කඳ ගාව හිටිං මං මේක දෙන්න පුළුවන්ද බලල එනකන්"

යැයි කියූ අප්පච්චි සිල්ලර කඩයක් ඇතුලට ඇදුනේ මා ඒ වළං කඳ අසල නවතා තබමිනි. ටික වේලාවකින් මුදලාලි සමග ආ අප්පච්චි මේ ටික අරං කියක් හරි දෙන්නයැයි පැවසුයේ බැරිම නැහ විය හැකියැයි මට සිතුනි.

"ලොකු උන්නැහේ මේවා ගත්තට දැන් විකිණෙන්නේ නෑ"

"අඑත් ඇලුමිණියම් වළං තියෙනවා එවා තමයි ඉල්ලන්නේ. ඒ හින්දා ඩිංගක් අර ඉස්සරහ බෝ ගහ යට කඩෙන් අහපන්"

යැයි කියමින් මුදලාලි කඩයට ඇතුලට සේන්දු විය. මා කඩය ඉදිරිපිට සම්බවලින් එල්ලා ඇති ඇලුමිනියම් හට්ටි මුට්ටි දෙස බැලුයේ එවා දිලිසෙන්නේ කෙසේදැයි සිතමිනි. අප්පච්චි කඳ කරට ගත්තේ මාගේ මුනුණවත් නොබලමිනි. අප්පච්චිට කේතලි ගොස් ඇති බව මටද හැඟී ගියෙන් කිසිත් නොකියාම ඔහු පසු පසින් මාද ඉදිරියට පා එසවුයෙමි. මඳ දුරක් ගිය අප්පච්චි බෝ ගහ යට කඩයට එහායින් වූ හිස් බිම මත කඳ බිම තබා ඇත තියාගෙන වළං වළං යැයි කියන්නට පටන් ගත්තේය. මා අසලින් ඉදගෙන යන එන අය දෙස බැලුයේ දැන් දැන් කවුරු හෝ වළං ගැනීමට අප අසල නවතිනු ඇතැයි සිතමිනි. නැත්දෑ වන තුරු රැඳී සිටියද වළං දෙකකට වඩා විකුනුනේ නැත. ඇඳිරි වැටී ගෙන එන විට අප්පච්චි මා වළං කඳ ළඟ රඳවා බෝ ගහ යට කඩයට ගොඩ වූයේ ය. මා මඳක් ඉදිරියට ගොස් අප්පච්චි කුමක් කරන්නේදැයි බලා සිටියෙමි.

"මුදලාලි.... කොල්ලා උදේ ඉඳන් බඩගින්නේ වළං විකිනුනෙත් නෑ. උෑට කන්ඩ මොනවා හරි දෙන්න පුළුවන්දැයි" අසනු මට යාත්තමට ඇසුණි.

"කොල්ලො ඔය බනිස් ගෙඩියක් දීපන්" යැයි මුදලාලි කියන විට අප්පච්චි මා දකිවි යැයි සිතා මා ආපසු හැරි වළං කඳ අසලට පැමිණ හිඳ ගනිමි.

අප්පච්චි කඩදාසි කොලයක ඔතන ලද බනිස් ගෙඩියක් රැගෙන මා අසලට විත්

"ඔක කලා කඩේට ගිහින් වතුර ටිකක් බීලා එරෙන් "

යැයි කිවේය. මා බනිස් ගෙඩිය අතට ගෙන එය දෙකට කඩා අප්පච්චි යැයි කියා ඔහු දෙසට බනිස් ගෙඩියෙන් අඩක් දිගු කලෙමි.

"එපා උඹ කාපං මං කැවා කඩේ ඇතුලෙදි"

යැයි පැවසු අප්පච්චි "කරුවල වැටී ගෙන එනවා මේක මුදලාලිටවත් දෙන්න පුළුවන්ද බලන්නම්" යැයි කිවේය. කඩා ගත් බනිසි කැබැල්ල කඩදාසියේ ඔතා කංගිට තියා ගන්නවා යැයි සිතූ මා එය අප්පච්චිගේ රෙදි මල්ලට දැමුයෙමි අප්පච්චි මා දෙස බලා ඔළුව අතගා දිගු සුසුමක් හෙලා කදත් රැගෙන කඩය අසළට ගියේය.

"මුදලාලි වළං ටික අරගෙන මට තියක් හරි දෙන්න" යැයි පැවසිය .

"වළං නං විකිණෙන්නේ නෑ දැන් අලුත් වළං තියෙනවා ඒත් උඹ කියන හින්දා ඔය වළං ටික තියපන් විකිණුනාට පස්සේ උඹට සල්ලි දෙන්නම්" යැයි පැවසිය .

"අනේ මුදලාලි ගෙදර හාල් ඇටයක්වත් නෑ පුළුවන් නම් තියක් හරි දෙන්න ඉතිරිවා පසසේ දෙන්න"

"එහෙනම් මෙතන රුපියල් විස්සක් තියෙනවා ඉතිරිවා විකිණුනාට පස්සේ බලමු "

අප්චිච්චිගේ ඉහේ මලක් පිපුණා වැනි විය. ලඟී ලඟියේ වළං ටික කඩේ කොල්ලාට දුන් අප්පච්චි හැලි හතරයි, හට්ටි අටයි, මැටි කෝප්ප පහයි, පොඩි හැලි තුනයි යැයි කියා මා දෙසට හැරී "යමං" යැයි කීය. බස් නැවතුමට එන විට ඉහළු ගම්මැද්ද බලා ඇදෙන බසය හිමින් ඉදිරියට ඇදෙනු දුටු අප්පච්චි මාද අමතක වුවා සේ "හෝව්! හෝව්!" යැයි කියමින් බසය පසුපස ටික දුරක් දිව ගියේය. එහෙත් බසය නොනවත්වා ඉදිරියට ඇදී ගියේ හුම් හඬ වැඩි කරමිනි. මා හුන් තැන රැඳී බලා සිටියෙමි. අප්පච්චි මහ හයියෙන් හඬමින් දෑත් පාරේ ගසමින් ඉකි බිඳිනු මා අඳුර තුළින් යාන්තමට දුටුවෙමි. මා හෙමින් හෙමින් අප්පච්චි සිටි තැනට ලඟා වුනෙමි. දැන්නම් ගෙදරට සේන්දු වීමට තව පැය දෙක තුනක්වත් පයින් ගමන් කලයුතු බව මට වැටහුණි. අප්පච්චි අල්ලා නැගිට්ටුවාලීමට හිතට ආවත් දැන් වාරු නැති බවක් හැඟී ගියෙන් මා ඔහු අසලම ගල් ගැසී බලා සිටියෙමි. මද වේලාවක් හැඩු අප්පච්චි පිටුපසින් පැමිණි තවත් වාහනයක එළිය දැක පාරනේ හිමින්සැරේ ඉවත් වුණි. එම වාහනය මද දුරක් ඉදිරියට ගොස් නවත්වනු දුටු අපි ඒ දෙස මහත් උනන්දුවෙන් පලා සිටියෙමි. සුදු සරමක් හා සුදු කමිසයක් හැඳගත් අයෙක් වාහනයෙන් බැස

"කොහාටද යන්නේ අපි ඉහල ගම් මැද්දට යනවා"

යැයි කිය. අප්පච්චි මගේ අතින් ඇදගෙන හනිතට වාහනයට ගොඩ වූ අතර අප්පච්චගේ ඔළුව වාහනයේ දොරේ වැදුණු බවත් මට දැණුනි.

"අනේ මහත්තයෝ පෙති පෙතිම බස් එක ගියාහොවැ"

යැයි අප්පච්චි කියා ඉන් පසු කිසින් කතා බහක් නොවූ අතර විටින් විට රියදුරු හා වාහනයේ පැමිණි මහතා කතා කරනවා ඇසිණි.

"අපි මෙතනින් බහිනවා මහත්තයෝ"

"ඔන්න ඔහොම නවත්වන්න"

අපි වාහනයෙන් බැස්සාට පසුව එය කළු දුම දමමින් ඉදිරියට ඇදුණි.

"රත්තරං වටින මිනිස්සුත් නාම ඉන්නවා මයේ පුතේ"

යැයි කියූ අප්පච්චි මාගේ අතින් අල්ලා ගත්තේ කලවරේ මා මහ හෙරේව් යැයි සිතූ නිසා යැයි මට සිතුනි.

උපුල් පතිරණ
(ඉඩම් අංශය)

ක්ෂිතිජයෙන් එහා...

කටෙත් කුලින් පැමිණ වැඩ බිමට
අඹදුවා සේදුවා පිය උපදන විලසට
උදෙන්ම බීදු කෂාව කෝප්පයෙන්
පදම් වී ඇති හිතේ තෘප්තියෙන්
දා හෙලුවත් බේ රියපත් කයෙන්
ක්ෂණික හවුහරිණක් නොවැරී කරුබෙට
අහෝවතේ පඩියට සේදුණා පීරිහැය
කැනේරමේ නෂාගේ ප්‍රේමයෙන්
යම්තමින් හෝ පිරවුණි ද හිස් කුස
හිරවුණා එක්වරම සෙව කුපිත වූ හැඳවත
හෙතත් දැම්බා ඇසිල්ලෙන් රෝහලට
ඔපසිසෙම චාෂනේ ලොකු අඹියා.
කවුරු එන්න ද බා බලන්නට
බලන් හිටියා ප්‍රනාල් විවරෙන්
ඇත ක්ෂිතිජයේ එහා ඉඹ දෙස
දුවුවෙ අපුරු දසුනෙකි
විදුලි සැරයක් ඇතපුරා ගිය ලෙසට
ඔපසිසේ ඕස්ලා සර්ලා රෑනක් නේද
ලඟී ලඟියේ බා බලන්නට එන
දිව ගියා බගේ ඇඳ වෙත
ඇඳ පුවා ඔවුන් විමසන පැණ ද
පිළිවදන් බා දෙන
ඇවිදුන් බලන වෙලාව ද ඉකුත් ගිය
පැමණි කෙනෙක් නම් නැත බා බලන්නට
චැරදුණාවත් ද චාට්ටුවේ පුරුෂය..
බා විතරද ඉන්නෙ ඔවුන්ට ඇවිත්
බලන්නට..

ජ.ඒ. සමන් විජේසිරි
පෙරටු කාර්යාලය

ඕනෑ රදවන..
සතුට ගෙන..
තවමත් පිටු පෙරලන..
කියවා නිබ නොකළ..
නුඹ පොතක්..
අහන් බර..

කල්පනී බණ්ඩාර
ප්‍රාදේශීය සහාය

ප්‍රාණ ත්‍රෛමාසික අන්තර්ජාල සඟරාව
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය
වරකාපොල
praanamagazine@gmail.com

උපදේශකත්වය
වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය ප්‍රාදේශීය ලේකම්
රංගන සජීව
වරකාපොල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලීය සහකාර ප්‍රාදේශීය ලේකම්
ශෂිකා කෝරළගේ

සංස්කාරක
චලානි ධිවන්ති හේරත් (සංවර්ධන නිලධාරී) 0776057275

සම්බන්ධීකරණ සහය
කල්හාර කුමාර (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර)
චතුරි ආරියරත්න (සංවර්ධන නිලධාරී)
ජානක රාජපක්ෂ (සංවර්ධන නිලධාරී)
අශෝක නුවන් කුමාර (සංවර්ධන නිලධාරී)

පරිගණක අක්ෂර හා පිටු සැකසුම
යසින්ත ප්‍රදීප්මාල් (සංවර්ධන නිලධාරී) 0712637846

සංවිධානය
මාධ්‍ය ඒකකය
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - වරකාපොල